## 1- 4 ශ්‍රේණිවල දී ඉගෙන ගත් පුරුෂ ලිංග නාම පද හා ස්ත්‍රී ලිංග නාම පද

1- තාත්තා - අම්මා
2- ගුරුතුමා - ගුරුතුමිය
3- සීයා - ආච්චි
4- විදුහල්පතිතුමා - විදුහල්පතිතුමිය
5- මල්ලි - නංගි
6- මුවා - මුවදෙන
7- කුරුල්ලා - කිරිල්ලී
8- මිතුරා - මිතුරිය
9- පුතා - දුව
10- සිංහයා - සිංහ ධේනුව
11- ගිරවා - ගිරවී
12- යහළුවා - යෙහෙළිය
13- කුකුළා - කිකිළි
14- නළුවා - නිළිය
15- රජ - රැජින
16- ඇතා - ඇතින්න
17- වෛද්‍යවරයා - වෛද්‍යවරිය
18- කොටියා - කොටිදෙන
19- ශිෂ්‍යයා - ශිෂ්‍යාව
20- සහෝදරයා - සහෝදරිය

## 5 ශ්‍රේණිය දී අලුතින් එකතු වන වචන

1- ලේඛකයා - ලේඛිකාව
2- කවියා - කිවිඳිය
3- ගොවියා - ගෙවිලිය
4- ඔහු - ඇය
5- දරුවා - දැරිය

## 1- 4 ශ්‍රේණිවල දී ඉගෙන ගත් ඒක වචන හා බහු වචන නාම පද

1- ගස - ගස්
2- කුරුල්ලා - කුරුල්ලෝ
3- මල - මල්
4- උදැල්ල - උදලු
5- ගල - ගල්
6- ගොවියා - ගොවියෝ
7- අම්මා - අම්මලා
8- බල්ලා - බල්ලෝ
9- තාත්තා - තාත්තලා
10- ගවයා - ගවයෝ
11- පොත - පොත්
12- පේළිය - පේළි
13- කුඹුර - කුඹුරු
14- කණ්ඩායම - කණ්ඩායම්
15- ළමයා - ළමයි
16- ගුරුවරයා - ගුරුවරු
17- ශිෂ්‍යයා - ශිෂ්‍යයෝ
18- රට - රටවල්
19- මම - අපි
20- ලේඛකයා - ලේඛකයෝ

## 5 ශ්‍රේණිය දී අලුතින් එකතු වන වචන

1- සපත්තුව - සපත්තු
2- පොකුර - පොකුරු
3- කාමරය - කාමර
4- දොර - දොරවල්
5- නැව - නැව්

## සමානාර්ථ පද

### 1, 2, 3, 4 ශ්‍රේණිවල දී ඉගෙන ගත් සමානාර්ථ පද

| | | | |
|---|---|---|---|
| 1- | ගස | = | රුක |
| 2- | අහස | = | ගුවන |
| 3- | අම්මා | = | මව |
| 4- | උදෑසන | = | හිමිදිරිය |
| 5- | තාත්තා | = | පියා |
| 6- | ඉර | = | හිරු |
| 7- | ගෙදර | = | නිවස |
| 8- | කුරුල්ලා | = | පක්ෂියා |
| 9- | පාසල | = | විදුහල |
| 10- | ඔළුව | = | හිස |
| 11- | පාර | = | මාර්ගය |
| 12- | පාදය | = | කකුල |
| 13- | තරු | = | තාරකා |
| 14- | ප්‍රවෘත්තිය | = | පුවත |
| 15- | කැලෑව | = | වනය |
| 16- | වතුර | = | ජලය |
| 17- | දූපත | = | දිවයින |
| 18- | රාත්‍රිය | = | රැය |
| 19- | ඇස් | = | නෙත් |
| 20- | පොත | = | ග්‍රන්ථය |

### 5 ශ්‍රේණිය දී අලුතින් එකතු වන වචන

| | | | |
|---|---|---|---|
| 1- | අවුරුද්ද | = | වසර |
| 2- | අර්ථය | = | තේරුම |
| 3- | නෙලුම් මල | = | සියපත |
| 4- | ප්‍රසිද්ධ | = | ප්‍රකට |

---

## විරුද්ධාර්ථ පද

### 1, 2, 3, 4 ශ්‍රේණිවල දී ඉගෙන ගත් විරුද්ධාර්ථ පද

| | | | |
|---|---|---|---|
| 1- | උඩ | - | යට |
| 2- | លොකු | - | පොඩි |
| 3- | මහතයි | - | කෙට්ටුයි |
| 4- | යහපත් | - | අයහපත් |
| 5- | උස | - | මිටි |
| 6- | කැමති | - | අකමැති |
| 7- | යනවා | - | එනවා |
| 8- | ආරම්භය | - | අවසානය |
| 9- | ඉදිරිපස | - | පිටුපස |
| 10- | පිපෙනවා | - | පරවෙනවා |
| 11- | පිරිසිදු | - | අපිරිසිදු |
| 12- | දිරන | - | නොදිරන |
| 13- | ඉහළ | - | පහළ |
| 14- | කීකරු | - | අකීකරු |
| 15- | ප්‍රශ්න | - | පිළිතුරු |
| 16- | සුදුසු | - | නුසුදුසු |
| 17- | ගැළපෙන | - | නොගැළපෙන |
| 18- | සෙමෙන් | - | වේගයෙන් |
| 19- | පුරුදු | - | නුපුරුදු |
| 20- | ලස්සන | - | අවලස්සන |

### 5 ශ්‍රේණිය දී අලුතින් එකතු වන වචන

| | | | |
|---|---|---|---|
| 1- | පැමිණීම | - | නොපැමිණීම |
| 2- | අවශ්‍ය | - | අනවශ්‍ය |
| 3- | පුහුණු | - | නුපුහුණු |
| 4- | වැරදි | - | නිවැරදි |
| 5- | අලුත් | - | පරණ |

**යුගල පද**   **3, 4 ශ්‍රේණිවල දී ඉගෙන ගත් යුගල පද**

1- ගමන් බිමන්
2- පොත් පත්
3- අහල පහල
4- ගෙවල් දොරවල්
5- සිරිත් විරිත්
6- යාන වාහන
7- තෑගි බෝග
8- වතු පිටි
9- කෑම බීම
10- කෙළි සෙල්ලම්

**5 ශ්‍රේණිය දී අලුතින් එකතු වන යුගල පද**

1- අනම් මනම්
2- විහිළු තහළු
3- වාද විවාද
4- අරුම පුදුම
5- අස්සක් මුල්ලක්

**(යුගල පද ලිවීමේ දී එම පද දෙක වෙන් කර ලිවිය යුතු බව මතක තබා ගන්න.)**

---

**ප්‍රස්තාව පිරුළු**   **3, 4 ශ්‍රේණිවල දී ඉගෙන ගත් ප්‍රස්තාව පිරුළු**

1- පරංගියා කෝට්ටේ ගියා වගේ
- *කිට්ටු පාරක් තිබිය දී දුර පාරකින් යෑම.*

2- මඩේ හිටවපු ඉත්ත වගේ
- *එක තීරණයක නොසිටීම.*

3- ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනවා වගේ
- *කෙනෙකුගෙන් කෙසේවත් ලබාගත නො හැකි දෙයක් ලබා ගැනීමට උත්සාහ දැරීම.*

4- ඉදිකටුවයි නූලයි වගේ
- *දෙදෙනෙක් සෑම විට ම එකට ම සිටීම.*

5- ළිඳේ ඉන්න ගෙම්බා වගේ
- *තමා අවට සමාජය පිළිබඳ අවබෝධයක් නොමැති ව සිටීම.*

6- ඉඟුරු දී මිරිස් ගත්තා වගේ
- *යම් අපහසුතාවකින් හෝ කරදරයකින් හෝ ගැලවීමට සිතා කරන ක්‍රියාවෙන් වඩාත් කරදරයකට හා අපහසුතාවට පත් වීම.*

7- ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ
- *අනුන් රවටන්නට ගොස් තමන් රැවටීම.*

8- කළුවා මාරපන් ගියා වගේ

- *විමසීමකින් තොර ව යමක් කිරීම.*

9- කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ

- *නුසුදුස්සාට තනතුරු/වරප්‍රසාද දීමෙන් අහංකාර වීම.*

10- කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ

- *තීරණ ගැනීමේ දී බුද්ධිමත් ලෙස කටයුතු නොකර නුසුදුසු තීරණ ගැනීම.*

## 5 ශ්‍රේණිය දී අලුතින් එකතු වන ප්‍රස්තාව පිරුළු

| | | |
|---|---|---|
| 1- | ගඟට ඉනි කැපුවා වගේ | - දුක් මහන්සියෙන් කළ වැඩක ප්‍රතිඵලයක් නොලැබීම. |
| 2- | රයිගමයයි ගම්පළයයි වගේ | - ගැළපෙන අදහස් හා ගතිගුණ එක වගේ තිබීම. |
| 3- | නරියා මිදි තිත්තයි කිවුවා වගේ | - යමක් කිරීමට උත්සාහ කර එය කර ගත නොහැකි විට එහි අගුණ කීම. |
| 4- | කට නිසා ඉබ්බා නැහුණා වගේ | - සුදුසු නුසුදුසු දේ විචාර බුද්ධියෙන් නොවිමසා කතා කිරීම. |
| 5- | මහදැනමුත්තාගේ නුවණ වගේ | - අදූරදර්ශී උපදෙස් දීම. |

---

**ඉඟිවැකි / රූඩී**

## 3, 4 ශ්‍රේණිවල දී ඉගෙන ගත් ඉඟිවැකි

| | | |
|---|---|---|
| 1- | එක හුස්මට | - යම් කිසි කාර්යයක් අවසන් වන තුරු නොනවත්වා කිරිම. |
| 2- | අකුරක් නෑර | - කිසිවක් අත නොහැර කියවීම සහ කතා කිරීම. |
| 3- | ඉහේ මලක් පිපුණා | - දැඩි සතුටකට පත් වීම. |
| 4- | අනූ නවයෙන් බේරුණා | - යම් විපතකින් යාන්තමින් ගැලවීම. |
| 5- | මොර සූරන වැස්ස | - අධික වර්ෂාව |

## 5 ශ්‍රේණිය දී අලුතින් එකතු වන ඉඟිවැකි

| | | |
|---|---|---|
| 1- | ඇඟ බේරගන්නවා | - වගකීමෙන් බේරිම. |
| 2- | හීන් දාඩිය දැම්මා | - දැඩි සේ බියට පත් වීම. |
| 3- | අහසේ මාලිගා හදනවා | - ඉටු නොවන සිහින මැවීම. |
| 4- | අබමල් රේණුවක් තරම් | - ඉතා ම කුඩා ප්‍රමාණයක් තිබීම. |
| 5- | මුරුංගා අත්තේ තියනවා | - රවටනු පිණිස වර්ණනා කිරීම. |

| ආප්තෝපදේශ | **5 ශ්‍රේණිය දී අලුතින් එකතු වන ආප්තෝපදේශ** |
|---|---|

1- අද කළ යුතු දේ හෙටට කල් නොදමන්න.

- *අද කළ යුතු දේ අද ම කරන්න. හෙටට කල් නොදමන්න.*

2- ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න.

- *ප්‍රමාණයට වඩා අහංකාර නොවන්න.*

3- පතින්න පෙර සිතා බලනු.

- *යමක් කිරීමට පෙර සිතා බලන්න.*

4- ඇවිළෙන ගින්නට පිදුරු නොදමන්න.

- *ආරවුලක් තව තවත් ඇවිස්සීමට කටයුතු නොකරන්න.*

5- උගත මනා ශිල්පය ම යි මතු රැකෙනා.

- *උගත් ශිල්පය ම මතු ආරක්ෂාව සලසයි.*

> සමානාර්ථ පද, විරුද්ධාර්ථ පද, යුගල පද, ප්‍රස්තාව පිරුළු, රූඩී/ඉඟි වැකි සහ ආප්තෝපදේශ සඳහා ගුරු මාර්ගෝපදේශයේ ලබා දී ඇති උදාහරණ පමණක් ගෙන ඉගැන්වීම අනිවාර්ය වේ. ඉන් පරිබාහිර වෙනත් උදාහරණ ප්‍රමාණය ද ඉක්මවා ඉගැන්වීම කිසි සේත් නොකළ යුතු ය.
>
> (උපුටා ගැනීම - 5 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය)

දුවේ පුතේ ඉහත දක්වා ඇත්තේ ගුරු මාර්ගෝපදේශයේ සඳහන් ඒවා වුව ද මෙයට අමතර ව 5 ශ්‍රේණියේ පෙළ පොතේ හමු වන සමානාර්ථ පද, විරුද්ධාර්ථ පද, යුගල පද, ප්‍රස්තාව පිරුළු, රූඩී/ඉඟි වැකි සහ ආප්තෝපදේශ සොයා දැන ගන්න. ඒවා ද ශිෂ්‍යත්වයට වැදගත් වේවි.